)පීශේම ඇපීලු!දි ටිචිරිමීපී
All Rights Reserved

# අවසාන වාර පරීක්ෂණය 2015

# ප්‍රායෝගික තාක්ෂණ කුසලතා

**9 ශ්‍රේණිය** | **කාලය පැය 2 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 50 කි. ඉතිරි ලකුණු ප්‍රමාණය ප්‍රායෝගික ක්‍රියාකාරකම මත පිරිනැමේ**

## I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01 මුං ඇට, කඩල, බිත්තර, දඹල, සෝයා බෝංචි වැනි ආහාර, ආහාර පිරමීඩයේ ඇතුළත් වන්නේ,

(1) ධාන්‍ය හා අල වර්ග (2) ධාන්‍ය හා සත්ත්ව ආහාර

(3) සත්ත්ව ආහාර හා මාෂ බෝග (4) එළවළු හා පලතුරු

02 ආහාරවල ඇති විවිධ ද්‍රව්‍ය ශරීරයේ ඇති හිස්ටැමීන් නම් ප්‍රෝටීනය හා නොගැලපීම නිසා සිරුර මගින් ප්‍රතික්ෂේප කිරීම හඳුන්වන්නේ,

(1) ආහාර අජීර්ණය (2) ආහාර විෂවීම

(3) අසාත්මිකතාවය (4) පණු රෝග

03 පොල්, මැංගුස්, අන්නාසි, කජු, රඹුටන්, කෙසෙල්, සියඹලා, මාළු වැනි ආහාර බහුලව ඇති පළාත වන්නේ,

(1) බස්නාහිර පළාත (2) උතුරු මැද පළාත

(3) දකුණු පළාත (4) වයඹ පළාත

04 ව්‍යාපාරයක් සඳහා මූල්‍ය නොවන උපකාර ලබාදෙන ආයතනයක් නොවන්නේ,

(1) ජාතික ආධුනිකත්ව හා වෘත්තීය පුහුණු අධිකාරිය

(2) කාර්මික සංවර්ධන මණ්ඩලය

(3) ආදායම් බදු ආයතනය

(4) කාර්මික තාක්ෂණ ආයතනය

05 ගෑස් උඳුනක් ස්ථානගත කිරීමේ දී සිවිලිමට හා අසල ඇති බිත්ති අතර තිබිය යුතු දුර ප්‍රමාණය පිළිවෙලින්,

(1) 50cm හා 10cm (2) 100cm හා 15cm

(3) 100cm හා 100cm (4) 100cm හා 10cm

06 ආහාර කීපයක් එකවර පිසගත හැකි කාලය, ශ්‍රමය පිරිමසන උපකරණයකි,

(1) ගෑස් උඳුන (2) භූමිතෙල් උඳුන

(3) විදුලි උඳුන (4) පීඩන උඳුන

07 ප්‍රධාන නායකත්ව ගති ලක්ෂණයක් නොවන්නේ,

(1) බුද්ධිමත් බව

(2) කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව

(3) තමා තුළම විශාල පෙළඹවීමක් ඇති කිරීම

(4) පක්ෂග්‍රාහී වීම

08 ව්‍යවසායකත්වය තුළදී, තමාගේ කාර්යයට අදාළව සේවකයන් කෙරෙහි, පාරිභෝගිකයන් කෙරෙහි, සමාජය හා ගනුදෙනුකරුවන් කෙරෙහි ඇති බැඳීම

(1) වගකීම වේ. (2) යුතුකම වේ.

(3) අයිතිවාසිකම් වේ. (4) ඉහත කිසිවක් නොවේ.

09 කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකුට තම ඉතිරිකිරීම් ආයෝජනය කළහැකි ක්‍රමයක් නොවන්නේ,

(1) ස්ථාවර වත්කම්වල ආයෝජනය කිරීම

(2) භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම

(3) බඩු මිලදී ගැනීම

(4) වාණිජ බැංකුවල තැන්පත් කිරීම

10 ශාක මගින් මිනිසා ලබන ප්‍රතිලාභ වන්නේ,

(1) සමාජයීය ප්‍රතිලාභ (2) ආර්ථික ප්‍රතිලාභ

(3) පාරිසරික ප්‍රතිලාභ (4) ඉහත සියල්ල (2 x 10 = 20)

## II කොටස

● **ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

01 (1) ඔබ දන්නා ව්‍යාපාර සංවිධාන 3 ක් නම් කරන්න. (ල. 03)

(2) ව්‍යවසායකයෙකුට මුහුණදීමට සිදුවන අවදානම් තත්ත්ව 3 ක් ලියන්න. (ල. 03)

(3) කුඩා පරිමාණ ව්‍යාපාරිකයෙකු ජාල සම්බන්ධතා පවත්වන ආයතන 4 ක් ලියා, කුඩා පරිමාණ ව්‍යාපාරයක් සැලසුම් කිරීමේ දී සලකා බැලිය යුතු උපකාරක සේවා 5 ක් ලියන්න. (ල. 04)

02 (1) හොඳ පිහියක තිබිය යුතු ලක්ෂණ 3 ක් ලියන්න. (ල. 03)

(2) පීඩන උඳුනක් භාවිතයේ දී සැලකිලිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(3) ගෑස් උඳුනක රූප සටහනක් ඇඳ පහත කොටස් 4 නම් කරන්න. (ල. 04)

1. භාජන රැඳවුම 2. ලෝහ තැටිය

3. දාහක වැස්ම 4. දාහක බඳ

03 (1) ඇසුරුම්කරණය යන්න හඳුන්වා ඉන් ඇති වාසි 3 ක් ලියන්න. (ල. 03)

(2) ලේබල්කරණය යනු කුමක්දැයි හඳුන්වා ලේබලයකින් දැනගත හැකි තොරතුරු 3 ක් ලියන්න. (ල. 03)

(3) කිරි මිදවීමට ක්‍රියාකරන බැක්ටීරියා වර්ග 2 නම් කර, ආහාර පිළියෙල කිරීමේ දී අනුගමනය කරනු ලබන සෞඛ්‍යාරක්ෂිත පුරුදු 4 ක් පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ල. 04)

04 (1) සමහර අවස්ථාවල දී ආහාර සිරුරට නොගැලපීම නිසා ඇතිවිය හැකි විවිධ රෝග 3 නම් කරන්න. (ල. 03)

(2) වයස අවුරුදු 14 සිසුවියකට ගැලපෙන දිවා ආහාරවේලක් ලියන්න. (ල. 03)

(3) ආහාර පිරමීඩය තුළ ඇති කොටස් නම් කර, අදාළ ආහාරය බැගින් ලියන්න. (ල. 04)